සැබැවින්ම ජුහය්නා ගෝත්රයේ කාන්තාවක් දුරාචාරයේ හැසිරී ගැබ්ගත් තත්ත්වයේ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණියාය.

ඉම්රාන් ඉබ්නු හුසෙයින් -රළියල්ලාහු අන්හුමා- විසින් වාර්තා කරන ලදී. "සැබැවින්ම ජුහය්නා ගෝත්රයේ කාන්තාවක් දුරාචාරයේ හැසිරී ගැබ්ගත් තත්ත්වයේ නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ, අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, දඬුවම් විඳින තත්ත්වයට මම පත්ව ඇත්තෙමි. එහෙයින් මා වෙත එය ක්රියාත්මක කරනු යැයි පවසා සිටියාය. පසුව අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඇයගේ භාරකරු කැඳවා: ඔබ ඇය වෙත යහපත් අයුරින් කටයුතු කොට, ඇය දරුවා ප්රසූත කළ විට ඇය කැටුවාගෙන මා වෙත එන්න යැයි පැවසූහ. ඔහුද ඒ අයුරින්ම සිදු කළේය. පසුව ඇයට (දඬුවම ක්රියාත්මක කරන මෙන්) නියෝග කළහ. පසුව ඇයව ඇගේ රෙදි කඩකින් බැඳ දමන ලදී. පසුව ඇය සම්බන්ධයෙන්
නියෝග කොට ඇයට ගල් ගසන ලදී. පසුව ඇය වෙත (ජනාසා) සලාතය ඉටු කළහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

ඉම්රාන් ඉබ්නු අල් හුසයෙින් -රළියල්ලාහු අන්හු- තුමාගේ හදීසයේ මෙසේ සඳහන් වී ඇත. සැබැවින්ම කාන්තාවක් දුරාචාරය හේතුවෙන් ගැබ්ගත් තත්ත්වයේ නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත පැමිණ, "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, දඬුවම් විඳින තත්ත්වයට මම පත්ව ඇත්තෙමි. එහෙයින් මා වෙත එය ක්රියාත්මක කරනු" යැයි පවසා සිටියාය. ඇය අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් තමන් වෙත දඬුවම ක්රියාත්මක කරන මෙන් ඉල්ලා සිටියාය. එනම්, එය ගල්ගසා මැරීමේ දඬුවමය. හේතුව ඇය විවාහක කාන්තාවක් වූ බැවිනි. පසුව අල්ලාහ්ගේ දූතයාණෝ - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඇයගේ භාරකරු කැඳවා: ඔබ ඇය වෙත යහපත් අයුරින් කටයුතු කර, ඇය දරුවා ප්රසූත කළ පසු ඇය කැටුවාගෙන මා වෙත එන්න යැයි පැවසූහ. "ඔබ ඇය වෙත යහපත් අයුරින් කටයුතු කරන්න“ යනුවෙන් කළ ප්රකාශය වනාහි ඔවුන්ගෙන් ඇයට ඇතිවන ලැජ්ජාව හා ක්රෝධය පිළිබඳ බියක් එතුමා තුළ ඇති වූ බැවිනි. ඔවුන්ගෙන් ඇතිවන නින්දාව ඇයව වේදනාවට පත් කරනු ඇත. එහෙයින් එයින් වැළකී සිටින මෙන් ඇය සම්බන්ධයෙන් ඔහුට උපදෙස් දුන්හ. එවිතරක් නොව ඇය පිළිබඳ වූ විශේෂ කරුණාවක් ද එයට හේතු විය. එය ඇය පාපක්ෂමාව ඇයද සිටි උදාර කාන්තාවක් වූ බැවිනි. ඇය මෙන් කාන්තාවන් පළවා නොහරිනු පිණිසත් වේදනාව ගෙන දෙන ප්රකාශයන් එවන් කාන්තාවන් සවන් නොදෙනු පිණිසත් මිනිසාගේ සිත් සතන් තුළ යහපත ඇති කර ගන්නා මෙන් දිරිගැන්වූහ. අනතුරුව ඇය දරුවා ප්රසූත කළ පසුව අතදරුවා කිරිවරන තෙක් ප්රමාද වී පැමිණෙන මෙන් නියෝග කළහ. පසුව අතදරුවා කිරිවැරූ පසු ඇය පැමිණියාය. පසුව එතුමා හද් දුරාචාරයේ දඬුවම ඇය වෙත ක්රියාත්මක කළහ. ඇයව ඈ සතු රෙදි කඩකින් බැඳ දමන මෙන් නියෝග කළහ. එය ඇයට ගල් ගසන විට ඇය දගලා ඇයගේ රහස් පෙදෙස් නිරාවරණය නොවනු පිණිසය. පසුව ඇය සම්බන්ධයෙන් දඬුවම ක්රියාත්මක කරන මෙන් නියෝග කොට ගල් ගසන ලදී. පසුව ඇය මත (ජනාසා) සලාතය ඉටු කළහ.

http://www.sunnah.global/hadeeth/si/show/5649